# මූලික පිරිවෙන් අවසාන විභාගය

# ඇගයීම් වාර්තාව

## 04-සංස්කෘත

## 2020

Curriculum
Assessment & Evalution
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# හැඳින්වීම

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත අනුව මූලික පිරිවෙන් විෂයමාලාව සිංහල, පාලි, සංස්කෘත, ත්‍රිපිටක ධර්මය, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන හර විෂයයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

අ.පො.ස (සා.පෙළ) මට්ටමේ පවතින මූලික පිරිවෙන් අවසාන විභාගය සමත් වීම අ.පො.ස (උ.පෙළ) විභාගය හෝ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සඳහා විද්‍යායතනයක හෝ මහා පිරිවෙනක අධ්‍යාපන ලැබීමට හැකි මගක් වේ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා පරිවේණාචාර්යවරු ද දැඩි වෙහෙසක් දරති. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020 සඳහා සකස් කරන මෙම ඇගයීම් වාර්තාව ඔවුන්ගේ එම අපේක්ෂා ඉටු කර ගැනීම පිණිස හේතු වනු ඇතැයි විශ්වාස කරමි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයන්ට, ගුරුභවතුන්ට, පරිවේණාචාර්යවරුන්ට, විෂයභාර පිරිවෙන් අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයන්ට එක සේ ප්‍රයෝජනවත් වනු ඇත. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාවේ අන්තර්ගතය ප්‍රධාන මාතෘකා පහක් යටතේ ගොනු කර ඇත.

මූලික පිරිවෙන් සංස්කෘත විෂයයෙහි විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ ප්‍රථම මාතෘකාව යටතේ අන්තර්ගත වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව, අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් අනුව පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය සංඛ්‍යාත්මක ව දක්වා ඇත. මෙම ඇගයීම් වාර්තාවේ දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද තෙවන මාතෘකාව යටතේ II ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද අන්තර්ගත වේ.

දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය, I ප්‍රශ්න පත්‍රය, I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු ලබාදීමේ පටිපාටිය, I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය, ප්‍රශ්නවල වරණ තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය හා ප්‍රශ්න පත්‍රයේ තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා තේමා අනුව විශ්ලේෂණයත් අවසාන ලෙස I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ද අන්තර්ගත වේ. තෙවන මාතෘකාවෙන් ඉදිරිපත් කර ඇති II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය යටතේ ද I ප්‍රශ්න පත්‍රයට අදාළ ව ඉදිරිපත් කර ඇති තොරතුරු ඒ ආකාරයට ඉදිරිපත් කර ඇති අතර මෙහිදී එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ , නිගමන හා යෝජනා ද එක් එක් ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව ද වෙන් වෙන් ව ඉදිරිපත් කර ඇත.

ප්‍රශ්නපත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි හතරවන හා පස්වන මාතෘකා යටතේ විග්‍රහ කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව අවබෝධ කර ගැනීමට මෙය සේ උපකාරී වනු ඇතැයි සිතමි.

උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය ( Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය(Item Response Theory) යොදාගනිමින් අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

මෙම වාර්තා සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රියව දායක වූ ලේඛක හා සංස්කරණ මණ්ඩල සාමාජිකයන්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරින්ටත් මාගේ හෘදයංගම ස්තුතිය පළ කරමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

2023.06.30

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

එච්. ජේ. එම්. සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

# පෙරවදන

යටත් විජිත යුගයේ දායාදයක් ලෙස දක්නට ලැබෙන වර්තමානයේ ක්‍රියාත්මක වන මෙරට ජාතික අධ්‍යාපන ක්‍රමය පාසල් පද්ධතිය පාදක කොටගෙන බිහිවූවත් ඉපැරණි ඓතිහාසික යුගයේ ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වූයේ පිරිවෙනයි.

භික්ෂූන් වහන්සේලා විසින් තමන්ගේ ආරාමය තුළ පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනික ආයතන විශේෂයක් වූ පිරිවෙන පර්යප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේද යන ත්‍රිවිධ ශාසනය පවත්වාගෙන යාම, එය පෝෂණය කිරීම, ඒ හා සම්බන්ධ අවශේෂ අවශ්‍යතා වන විනය හා ත්‍රිපිටක ඥානය ලබා දීම, ධර්ම ගරුක බවකින් යුත් භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන් හි නිරත වීම හා බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, පාලි, සංස්කෘත ඇතුළු භාෂා හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනුම ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දීමටත් යන මූලික දෑ අරමුණු කොටගෙන පිහිටුවා ඇත.

මෙසේ පිහිටුවන ලද ප්‍රධාන පිරිවෙන් මගින් බෞද්ධ අධ්‍යාපනයේ දියුණුවට හා භාෂා සාහිත්‍යයේ වර්ධනයට අනුපමේය සේවාවක් සිදු වූ බැවින් ශාස්ත්‍ර පිපාසයෙන් සිටි විදේශ ශිෂ්‍යයන් පවා මෙම පිරිවෙන්වල අධ්‍යාපනය ලබා ගැනීමට 14 හා 15 සියවස් තුළ ශ්‍රී ලංකාවට පැමිණ ඇත. තොටගමුවේ විජයබා, කැරගල පද්මාවතී, වීදාගම සිරි ඝනානන්ද, දෙවිනුවර තිලක හා පැපිළියානේ සුනේත්‍රාදේවී යන පිරිවෙන් එකල පැවති ප්‍රසිද්ධ පිරිවෙන් කිහිපයක් වේ.

කාලයේ ඇවෑමෙන් යම් යම් වෙනස්කම්වලට ලක් ව වල් බිහි වූ පිරිවෙන් අධ්‍යාපනය නැවත නගා සිටු වූයේ වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ දායකත්වයෙනි. සාම්ප්‍රදායික හරයන් ආරක්ෂා කර ගනිමින් ස්වකීය අධ්‍යාපන ක්‍රමය වර්තමානයට උචිත වන පරිදි සජීවි ව හා කාලය විසින් බැහැර කරනු නොලබන හරයන් මත පිහිට වූ පරමාර්ථ ඵලදායී ලෙස ඉටු කර ගත හැකි ලෙස පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් විය. මේ ආකාරයට 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතට අනුව මූලික පිරිවෙන් විෂය මාලාවක් නිර්මාණය වූ අතර එය සිංහල, පාලි, ත්‍රිපිටක ධර්මය, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාව හා ගණිතය යන හර විෂයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සෞඛ්‍ය, සමාජ විද්‍යාව හා දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

මූලික පිරිවෙන් අවසාන විභාගය පළමු වතාවට වර්ෂ 1981 දී පවත්වන ලදි. ඒ සඳහා අපේක්ෂකයන් 362ක් පෙනී සිටි අතර ඉන් අපේක්ෂකයන් 227 ක් විභාගය සමත් විය.

වර්තමානයේ දී සාමාන්‍ය පෙළ විභාගය හා සම මට්ටමේ ලා සලකනු ලබන මෙම විභාගයේ දී අපේක්ෂයෙකු අනිවාර්ය විෂයයන් 06ක් සමග යටත් පිරිසෙයින් වෛකල්පික විෂයයන් 02ක්වත් තෝරා ගත යුතු ය. විභාගය සඳහා පෙනී සිටිය හැකි උපරිම විෂය ගණන 10කි. මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන් ම පවත්වනු ලබන අතර ත්‍රිපිටක ධර්මය විෂයය සමග පාලි හෝ සිංහල ඇතුළු විෂයයන් 06කින් සමත් විය යුතුය. එසේ නොවී විෂයයන් 05ක් සමත් වුවහොත් ඌන සාමර්ථ්‍යය හිමි වන අතර වර්ෂ දෙකක් ඇතුළත එම ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතු ය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් මූලික පිරිවෙන් අවසාන විභාගය සඳහා 2019 වර්ෂයේ සිට ඉදිරිපත් කරනු ලබන මෙම ඇගයීම් වාර්තා පද්ධතියේ ගුරු, ශිෂ්‍ය, නිලධාරීන්ගේ අවබෝධය පිණිස හා ත්‍රිවිධ ශාසනයේ පැවැත්ම උදෙසා ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා බිහි කරන පිරිවෙන් අධ්‍යාපන පද්ධතියේ චිරස්ථිතිය පිණිස හේතුවේවායි ප්‍රාර්ථනා කරමි.

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

උපදේශකත්වය : එච්. ජේ. එම්. සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

මෙහෙයවීම හා අධීක්ෂණය : ගයාත්‍රි අබේගුණසේකර
විභාග කොමසාරිස්
(පර්යේෂණ හා සංවර්ධන)

සම්බන්ධීකරණය හා සංවිධානය : ඩී. ඩී. වයි. සමරසිංහ
නියෝජ්‍ය විභාග කොමසාරිස්
(පර්යේෂණ හා සංවර්ධන - ආයතනික විභාග)

විෂය සම්බන්ධීකරණය : ඩබ්. සී. ප්‍රියදර්ශනී
සහකාර විභාග කොමසාරිස්
(පර්යේෂණ හා සංවර්ධන)

සංස්කරණය : පූජ්‍ය උඩවෙල රේවත හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයන අංශය,
කැලණිය විශ්වවිද්‍යාලය

පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන අංශය
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය , බත්තරමුල්ල

පූජ්‍ය රූපහ ඤාණරතන හිමි
නියෝජ්‍ය පරිවේණාධිපති
ශාසනවර්ධන පිරිවෙන
මීරිගම

ලේඛක මණ්ඩලය : පූජ්‍ය උඩවෙල රේවත හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයන අංශය,
කැලණිය විශ්වවිද්‍යාලය

පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන අංශය
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය බත්තරමුල්ල

පූජ්‍ය රූපහ ඤාණරතන හිමි
නියෝජ්‍ය පරිවේණාධිපති
ශාසනවර්ධන පිරිවෙන
මීරිගම

ජේ. සුගත් පද්මසිරි
පරිවේණාචාර්ය
නො 32/29,
ඇල්පිටිය, ගොඩකවෙල

ඩබ්. ජේ. අජිත් කුමාර
පරිවෙණාචාර්ය
ගොඩගෙවත්ත, කොට්ටව පාර,
වදුරඹ, ගාල්ල

පරිගණක පිටපත සැකසුම : ජේ. කේ. එච්. නවෝදනී ජයනෙත්ති
දත්ත සටහන් සහකාර

පිටකවරය නිර්මාණය : ආර්. එම්. නිලුපුල් ශෙහාන් යසරත්න
දත්ත සටහන් සහකාර

# පටුන


පිටු අංකය

**1. සංස්කෘත විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු**

**1.1** සංස්කෘත විෂයය අධ්‍යයනයේ අරමුණු 1

**1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු**

1.2.1 විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 2

1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2

1.2.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය පන්ති ප්‍රාන්තර අනුව 4

**I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය**

**2. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

2.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 6

2.2. I ප්‍රශ්න පත්‍රය ( ප්‍රශ්න 1 සිට 40 දක්වා) 7

2.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 11

2.4 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය 12

2.5 I පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) 13

2.6 I ප්‍රශ්න පත්‍රයේ තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා තේමා අනුව විශ්ලේෂණය 14

2.7 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 17

**II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය**

**3. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු**

3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 20

3.2 II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න තෝරා ඇති ආකාරය 21

3.3 II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය 21

3.4 II ප්‍රශ්න පත්‍රයේ සාධනය පිළිබඳ විශ්ලේෂණය 22

3.5 II ප්‍රශ්න පත්‍රය එක් එක් ප්‍රශ්නය, අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය හා විශ්ලේෂණය 23

3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ආකාරය ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ හා නිගමන 40

**4. පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු** 41

**5. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා** 42

# 1 සංස්කෘත විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

## 1.1 සංස්කෘත විෂයය අධ්‍යයනයේ අරමුණු

01. භාෂාන්තර වර්ණමාලා පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයකට පෙළඹවීමක් ලැබීම
02. මාතෘභාෂාව නිවැරදි ව භාවිත කිරීමට මූලාධාර වීම
03. ආයුර්වේදය, ජ්‍යෝතිර්විද්‍යාව, නක්ෂත්‍රශාස්ත්‍රය වැනි විවිධ ශාස්ත්‍ර, කලාශිල්ප හා දර්ශනවාද ඉගෙනීමේ දී ව්‍යවහාර භාෂාවක් වශයෙන් දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනයට ශක්තිමත් පදනමක් සැපයීම
04. පෙරදිග භාෂා අධ්‍යයනයට අත්වැලක් සැපයීම
05. ඓතිහාසික මූලාශ්‍රය ගවේෂණය සඳහා උපකාරී වීම
06. භාෂාවන්හි වාග්විද්‍යාත්මක ව්‍යවහාරයන් පිළිබඳ මූලික දැනුම හා පාරිභාෂික ශබ්දමාලාවන්හි ව්‍යූහය හඳුනා ගැනීමට මූලාධාර වීම
07. සාහිත්‍ය රසාස්වාදයට රුකුලක් වීම
08. හරධර්ම චරිතායනයට සහය වීම
09. තොරතුරු තාක්ෂණය සඳහා විධිමත් භාෂා මාධ්‍යයක් ගොඩනැගීමට මූලාධාර වීම
10. විශ්වීය කේත (Universal Code) ක්‍රමයකට අවශ්‍ය විද්‍යාත්මක භාෂා අධ්‍යයනය සඳහා රුකුලක් වීම
11. සංස්කෘත භාෂාවෙන් ලියවී ඇති මූලාශ්‍රය අධ්‍යයනයෙන්, අන්තර් ආගමික සමගියට අවශ්‍ය දායකත්වය ලබාදීම
12. ලෞකික සංස්කෘත සාහිත්‍යය හා තදනුබද්ධ සංස්කෘත සාහිත්‍යය අධ්‍යයනය කිරීමෙන් ජීවන පරමාර්ථ සාධනය සඳහා මනා රුකුලක් වීම
13. විෂයාන්තර දැනුම උද්ග්‍රහණයට මූලාධාර වීම
14. නව නිර්මාණකරණයට අවශ්‍ය අත්වැල සැපයීම.

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

| මාධ්‍යය | පිරිවෙන් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 2325 | 22 | 2347 |
| ඉංග්‍රීසි | 18 | 0 | 18 |
| **එකතුව** | **2343** | **22** | **2365** |

වගුව 1.1

### 1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පිරිවෙන් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 166 | 7.1 | 0 | 0 | 166 | 7.02 |
| B | 185 | 7.90 | 1 | 4.55 | 186 | 7.9 |
| C | 656 | 28.00 | 1 | 4.55 | 657 | 27.8 |
| S | 851 | 36.3 | 10 | 45.45 | 861 | 36.4 |
| W | 485 | 20.70 | 10 | 45.45 | 495 | 20.93 |
| **එකතුව** | **2343** | **100.00** | **22** | **100.00** | **2365** | **100.00** |

වගුව 1.2

## 1.2.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 147 | 18 | 12.24 | 22 | 14.97 | 43 | 29.25 | 45 | 30.61 | 128 | 87.07 | 19 | 12.93 |
| ගම්පහ | 201 | 20 | 9.95 | 15 | 7.46 | 48 | 23.88 | 70 | 34.83 | 153 | 76.12 | 48 | 23.88 |
| කළුතර | 159 | 12 | 7.55 | 14 | 8.81 | 53 | 33.33 | 56 | 35.22 | 135 | 84.91 | 24 | 15.09 |
| මහනුවර | 288 | 44 | 15.28 | 40 | 13.89 | 89 | 30.90 | 87 | 30.21 | 260 | 90.28 | 28 | 9.72 |
| මාතලේ | 77 | 1 | 1.30 | 3 | 3.90 | 19 | 24.68 | 43 | 55.84 | 66 | 85.71 | 11 | 14.29 |
| නුවරඑළිය | 40 | 2 | 5.00 | 1 | 2.50 | 13 | 32.50 | 19 | 47.50 | 35 | 87.50 | 5 | 12.50 |
| ගාල්ල | 192 | 15 | 7.81 | 17 | 8.85 | 55 | 28.65 | 66 | 34.38 | 153 | 79.69 | 39 | 20.31 |
| මාතර | 158 | 6 | 3.80 | 14 | 8.86 | 47 | 29.75 | 53 | 33.54 | 120 | 75.95 | 38 | 24.05 |
| හම්බන්තොට | 126 | 7 | 5.56 | 10 | 7.94 | 46 | 36.51 | 44 | 34.92 | 107 | 84.92 | 19 | 15.08 |
| වවුනියාව | 2 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 50.00 | 1 | 50.00 | 2 | 100.00 | 0 | 0.00 |
| අම්පාර | 71 | 0 | 0.00 | 4 | 5.63 | 9 | 12.68 | 33 | 46.48 | 46 | 64.79 | 25 | 35.21 |
| ත්‍රිකුණාමලය | 20 | 0 | 0.00 | 4 | 20.00 | 1 | 5.00 | 10 | 50.00 | 15 | 75.00 | 5 | 25.00 |
| කුරුණෑගල | 220 | 12 | 5.45 | 11 | 5.00 | 55 | 25.00 | 80 | 36.36 | 158 | 71.82 | 62 | 28.18 |
| පුත්තලම | 48 | 0 | 0.00 | 0 | 0.00 | 9 | 18.75 | 14 | 29.17 | 23 | 47.92 | 25 | 52.08 |
| අනුරාධපුර | 159 | 8 | 5.03 | 3 | 1.89 | 39 | 24.53 | 73 | 45.91 | 123 | 77.36 | 36 | 22.64 |
| පොළොන්නරුව | 50 | 0 | 0.00 | 1 | 2.00 | 5 | 10.00 | 17 | 34.00 | 23 | 46.00 | 27 | 54.00 |
| බදුල්ල | 110 | 9 | 8.18 | 7 | 6.36 | 32 | 29.09 | 44 | 40.00 | 92 | 83.64 | 18 | 16.36 |
| මොණරාගල | 81 | 0 | 0.00 | 7 | 8.64 | 21 | 25.93 | 38 | 46.91 | 66 | 81.48 | 15 | 18.52 |
| රත්නපුර | 114 | 6 | 5.26 | 5 | 4.39 | 39 | 34.21 | 40 | 35.09 | 90 | 78.95 | 24 | 21.05 |
| කෑගල්ල | 102 | 6 | 5.88 | 8 | 7.84 | 33 | 32.35 | 28 | 27.45 | 75 | 73.53 | 27 | 26.47 |
| සමස්ත ප්‍රතිඵලය | **2365** | **166** | **7.02** | **186** | **7.86** | **657** | **27.78** | **861** | **36.41** | **1870** | **79.07** | **495** | **20.93** |

වගුව 1.3

### 1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 -100 | 14 | 0.59 | 2365 | 100.00 |
| 81 - 90 | 39 | 1.65 | 2351 | 99.41 |
| 71 - 80 | 103 | 4.36 | 2312 | 97.76 |
| 61 - 70 | 173 | 7.32 | 2209 | 93.40 |
| 51- 60 | 252 | 10.66 | 2036 | 86.09 |
| 41 - 50 | 476 | 20.13 | 1784 | 75.43 |
| 31 - 40 | 496 | 20.97 | 1308 | 55.31 |
| 21 - 30 | 505 | 21.35 | 812 | 34.33 |
| 11 - 20 | 283 | 11.97 | 307 | 12.98 |
| 01 - 10 | 24 | 1.01 | 24 | 1.01 |
| 00 - 00 | 0 | 0.00 | 0 | 0.00 |

වගුව 1.4

ඉහත වගුව අධ්‍යයනයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදාහරණය -:31 - 40 අතර පන්ති ප්‍රාන්තරය සලකා බලන විට මෙම විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් 2365 අතුරෙන් ලකුණු 31 - 40 අතර ලබාගත් සංඛ්‍යාව 496කි. එය ප්‍රතිශතයක් ලෙස 20.97කි. ලකුණු 40ක් හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 1308ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 55.31කි.

# I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 2 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

| |
|---|
| **කාලය : පැය 01 යි.**<br><br>වරණ 04 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 40කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි. |

## 2.2 I ප්‍රශ්න පත්‍රය

සැලකිය යුතුයි / Note :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
  Answer all questions. This paper carries 40 marks.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
  In each of the questions from 1 to 40, pick one of the alternatives (1), (2), (3), (4) which is correct or most appropriate.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
  Mark a cross (x) on the number corresponding to your choice in the answer sheet provided.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.
  Further instructions are given on the back of the answer sheet. Follow theme carefully.

1. සංස්කෘත භාෂාවේ ගුණ අක්ෂර සංඛ්‍යාව ඇතුළත් වරණය කුමක් ද?
   What is the option that contains the correct number of *Guṇa* letters?
   (1) දෙකකි. Two (2) තුනකි. Three (3) හතරකි. Four (4) නවයකි. Nine

2. වෘද්ධි අක්ෂර පමණක් සඳහන් වරණය තෝරන්න.
   Select the option which contains only *Vṛddhi* letters.
   (1) आ ई ऊ ॠ। (2) ए ऐ ओ औ। (3) ए ऐ आर् अल्। (4) आ ऐ औ आर्।

3. කණ්ඨජාක්ෂර පමණක් අයත් වරණය වන්නේ,
   The option that contains only the Gutturals (*Kaṇṭhajākṣara*) is
   (1) अ क ग घ ह। (2) आ ख ङ य श। (3) क च ट त प। (4) अ आ ह ल स।

4. मात्रा - गुरून् යන පදවල විභක්ති පිළිවෙළින් අයත් වරණය වන්නේ,
   The option that contains the cases मात्रा - गुरून् in correct order is
   (1) प्रथमा - द्वितीया। (2) तृतीया - द्वितीया। (3) द्वितीया - तृतीया। (4) पञ्चमी - तृतीया।

5. मुनौ - साधवे යන පදවල අර්ථය වන්නේ,
   The meaning of the words मुनौ - साधवे is
   (1) මුනිවරු දෙදෙන - සත්පුරුෂයෝ දෙදෙනා
   Two sages – Two gentlemen
   (2) මුනිවරයා කෙරෙහි - සත්පුරුෂයාට
   In the sage – To the gentleman
   (3) මුනිවරයාගේ - සත්පුරුෂයාගෙන්
   Of the sage - From the gentleman
   (4) මුනිවරයා විසින් - සත්පුරුෂයා කෙරෙහි
   By the sage – In the gentleman

6. मधु तिष्ठति <u>जिह्वाग्रे</u>। යටින් ඉරි ඇඳි පදයෙහි යෙදී ඇති කාරකය කුමක් ද?
   What is the *kāraka* of the underlined word in मधु तिष्ठति <u>जिह्वाग्रे</u>। ?
   (1) अधिकरणकारक। (2) अपादानकारक। (3) करणकारक। (4) सम्प्रदानकारक।

7. शाला ශබ්දයෙහි සප්තමී විභක්ති ඒකවචනය කුමක් ද?
   What is the locative singular of the stem शाला ?
   (1) शालया। (2) शालायाम्। (3) शालासु। (4) शाले।

8. अवोचत् යන ආඛ්‍යාතපදය අයත් වන්නේ,
   The finite verb अवोचत् belongs to
   (1) लट् परस्मैपद बहुवचनम्। (2) लङ् परस्मैपद एकवचनम्।
   (3) लङ् आत्मनेपद द्विवचनम्। (4) विधिलिङ् परस्मैपद एकवचनम्।

9. नीयते - भवेत् ආඛ්‍යාතයන්හි ලකාර පිළිවෙළින් අයත් වරණය තෝරන්න.
Select the option that contains the tenses (*lakāras*) of the verbs नीयते - भवेत् in the order.
(1) लट् - विधिलिङ्। (2) लोट् - लट्। (3) लङ् - विधिलिङ्। (4) लट् - लृट्।

10. √पठ् - लोट् ලකාර පරස්මෛපද උත්තමපුරුෂ ඒකවචන රූපය තෝරන්න.
Select the imperative mood (लोट् *lakāra*) *parasmaipada* first person singular of √पठ् - लोट्
(1) पठतु। (2) पठत। (3) पठेत्। (4) पठानि।

11. අතීතකාල සූචක ලකාරය වන්නේ,
The tense (*lakāra*) indicative of the past tense is
(1) लोट्। (2) लङ्। (3) विधिलिङ्। (4) लृट्।

12. कस्मिन् + चित्। යන්නෙහි නිවැරදි සන්ධිය වන්නේ,
The correct sandhi form of कस्मिन् + चित् is
(1) कस्मिंश्चित्। (2) कस्मिन्चित्। (3) कस्मिञ्चित्। (4) कस्मिञ्चित्।

13. नीतिरेषा යන්නෙහි නිවැරදි විසන්ධිය වන්නේ,
The correct disjoint form of नीतिरेषा is
(1) नीतिः + रेषा। (2) नीतिः + एषा। (3) नीतिर् + ईषः। (4) नीति + एषा।

14. तारागणैरपि। යන සන්ධිපදය අයත් වන්නේ,
The sandhi word तारागणैरपि belongs to
(1) स्वरसन्धिः। (2) विसर्गसन्धिः। (3) अनुस्वारसन्धिः। (4) व्यञ्जनसन्धिः।

15. मम दारको भक्षितः इति यावदागच्छति तावत्सुतस्तथैव सुप्तस्तिष्ठति। මෙහි ඇතුළත් සන්ධිපද සංඛ්‍යාව තෝරන්න.
Select the number of sandhi words in मम दारको भक्षितः इति यावदागच्छति तावत्सुतस्तथैव सुप्तस्तिष्ठति
(1) දෙකකි Two (2) හතරකි Four (3) පහකි Five (4) හයකි Six

16. කර්මධාරය සමාසපදයක් වන්නේ,
A *Karmadhāraya* compound form is
(1) मधुरफलम्। (2) पञ्चशीलम्। (3) वृक्षलता। (4) देवलोकः।

17. लम्बकर्णः යන්න කුමන සමාසයට අයත් වන්නේ ද?
To which kind of compound does the word लम्बकर्णः belong to ?
(1) द्विगुसमास। (2) कर्मधारयसमास। (3) बहुव्रीहिसमास। (4) तत्पुरुषसमास।

18. कनिष्ठः යන්න කුමන තද්ධිතයට අයත් වන්නේ ද?
To which kind of derivative noun does the word कनिष्ठः belong to?
(1) अतिशयार्थतद्धित। (2) भावतद्धित। (3) अस्त्यर्थतद्धित। (4) अपत्यतद्धित।

19. पाण्डित्यम् යන්නෙහි යෙදී ඇති තද්ධිත ප්‍රත්‍යය කුමක් ද?
What is the suffix used for the derivative noun पाण्डित्यम् ?
(1) यण्। (2) ईय। (3) अण्। (4) डिमन्।

20. "लोकहितं मम करणीयम्।" යටින් ඉරි ඇඳි පදය
The underlined word in "लोकहितं मम करणीयम्।" is
(1) අනාගතකාල කෘදන්තයකි. A future participle.
(2) අතීතකාල කෘදන්තයකි. A past participle.
(3) වර්තමානකාල කෘදන්තයකි. A present participle.
(4) අතීතකාල කර්මකාරක කෘදන්තයකි. A past passive participle.

21. √गम् ධාතුවෙන් තැනෙන පූර්වක්‍රියා රූපය වන්නේ,
The gerund (पूर्वक्रिया) formed from the root √गम् is

(1) गन्तुम्। (2) गतः। (3) गन्तव्यम्। (4) गत्वा।

22. कार्य යන්නෙහි කෘදන්ත ප්‍රත්‍යය වෙන් වන්නේ,
The participle suffix of कार्य is separated as

(1) कार् + य। (2) कृ + य। (3) कृ + र्य। (4) कर् + य।

23. අතීතකාල කෘදන්ත පමණක් ඇති වරණය වන්නේ,
The option that contains only past participles is

(1) कृतम् - उक्तवान्। (2) पठिता - गमनीयम्।
(3) करिष्यत् - भूतवान्। (4) नीयमानः - ज्ञातः।

24. एकवारं दृष्टं नरं मा विस्मर। අර්ථය වන්නේ,
The meaning of एकवारं दृष्टं नरं मा विस्मर is

(1) නරක මිනිසා එක්වරක්වත් අමතක නොකරන්න.
Don't forget the bad man at least one.
(2) මොහොතක්වත් නරක මිනිසා මතක් කරන්න එපා.
Don't remember the bad man at least for a moment.
(3) එක්වරක් දුටු මිනිසා අමතක කරන්න එපා.
Don't forget the man you saw at least one time.
(4) දුටු මිනිසා එක් වරක් මතක් කරන්න.
Remember the man you saw at least once.

25. "<u>7.10ට</u> පාඩම් කරන්න" යටින් ඉරි ඇඳි පදයෙහි අර්ථය වන්නේ,
The correct translation of the underlined phrase of " study at <u>7.10</u>" is

(1) दशाधिक सप्तवादनम्। (2) दशोन सप्तवादनम्।
(3) सपाद सप्तवादनम्। (4) सप्ताधिक दशवादनम्।

26. "කොහොමහරි පත්තරය අරං එන්න" නිවැරදි පරිවර්තනය වන්නේ,
The correct translation of "However bring the newspaper" is

(1) कथमपि पत्रम् आनयतु। (2) कथमपि वार्तापत्रिका आनय।
(3) कथं पत्रिका आनयति इति। (4) कदापि वार्तापत्रिका आनय।

27. त्वम् इच्छसि। गृहाण। යන වාක්‍යද්වය, සුදුසු පරිදි වාක්‍යයක් ලෙස ලියනු ලබන්නේ,
The suitably combined form of the two sentences त्वम् इच्छसि। गृहाण। is

(1) यदि त्वम् इच्छसि तदा गृहाण। (2) त्वं यावद् इच्छसि तावद् गृहाण।
(3) यद्यपि त्वम् इच्छसि चेत् गृहाण। (4) यदा त्वम् इच्छसि तथा गृहाण।

28. ප්‍රථම සංස්කෘත මහාකාව්‍ය රචකයා කවුද?
Who is the author of the first *Mahākāvya* in Sanskrit?

(1) महाकविकालिदासः। (2) भदन्ताश्वघोषः।
(3) कुमारदास राजा। (4) श्रीमद्दण्डी।

29. මහාකාව්‍යයක සර්ග සංඛ්‍යාව වන්නේ,
The number of cantoes in a *Mahākāvya* is

(1) 08 - 30 අතර
between 08 - 30
(2) 13 - 18 අතර
between 13 - 18
(3) 50 - 100 අතර
between 50 - 100
(4) 100 - 200 අතර
between 100 - 200

30. මේඝදූතය යනු,
*Meghadūta* is a

(1) महाकाव्यम्। (2) चम्पूकाव्यम्। (3) खण्डकाव्यम्। (4) गद्यकाव्यम्।

31. පශ්චාත් කාලිදාස මහාකාව්‍ය දෙකක් වන්නේ,
The two post Kalidāsa *Mahākāvyas* are
(1) सौन्दरनन्दं - जानकीहरणम्। (2) ऋतुसंहारं - रावणवधम्।
(3) शिशुपालवधं - कुमारसम्भवम्। (4) रावणवधं - जानकीहरणम्।

32. සුහෘද්භේදය අයත් වන්නේ කුමන ග්‍රන්ථයකට ද?
To which text does the *Suhṛdbheda* belong to?
(1) පඤ්චතන්ත්‍රයට ය. To *Pañcatantra*
(2) හිතෝපදේශයට ය. To *Hitopadeśa*
(3) අපරීක්ෂිතකාරකයට ය. To *Aparīkṣitakāraka*
(4) කාව්‍යාදර්ශයට ය. To *Kāvyādarśa*

33. හිතෝපදේශය රචනා කරන ලද්දේ කුමන රජුගේ පුත්‍රයන්ට ද?
For whose king's sons has the *Hitopadeśa* been written?
(1) अमरशक्ति। (2) सुदर्शन। (3) विक्रमादित्य। (4) अनन्तशक्ति।

34. අභිඥානශාකුන්තල නාටකයෙහි අඞ්ක සංඛ්‍යාව කොපමණ ද?
How many are there in the *Abhijñānaśākuntalam* Acts?
(1) හතරකි. Four (2) පහකි. Five (3) හතකි. Seven (4) දහයකි. Ten

35. දශකුමාරචරිතයෙහි උච්ඡ්වාස සංඛ්‍යාව කීය ද?
How many chapters are there in the *Daśakumāracarita*?
(1) දෙකකි. Two (2) තුනකි. Three (3) පහකි. Five (4) දහයකි. Ten

36. බ්‍රාහ්මණී-නකුල කථාවෙහි හමු වන බ්‍රාහ්මණයා කවුද?
Who is the Brahmin we meet in *Brahmani-nakula* kathā?
(1) देवशर्मा। (2) विष्णुशर्मन्। (3) हरिदत्त। (4) कथाप्रिय।

37. රඝුවංශයෙහි සඳහන් රජ පෙළපත කුමක් ද?
What is the dynasty mentioned in the *Raghuvaṃśa*?
(1) සූර්යවංශික රජපෙළපත *Sūryavaṃśa* dynasty
(2) ගුප්තවංශික රජපෙළපත *Guptavaṃśa* dynasty
(3) ලම්බකර්ණ රජපෙළපත *Lambakarṇa* dynasty
(4) පල්ලව රජපෙළපත *Pallava* dynasty

38. සුවර්ණාක්ෂී යනු කවර තැනැත්තියක් ද?
Who is *Suvarṇākṣī* ?
(1) රත්නාවලීගේ නැගණියෝ ය. Sister of *Ratnāvali*
(2) අශ්වඝෝෂ හිමියන්ගේ මෑණියෝ ය. Mother of *Aśvaghoṣa*
(3) ශ්‍රී හර්ෂගේ මෑණියෝ ය. Mother of *Śrī Harṣa*
(4) කුමාරදාස රජුගේ අගබිසව ය. Queen of king *kumāradāsa*

39. මිත්‍රභේදයෙහි සඳහන් අතුරු කථා සියල්ල කොපමණ ද?
How many sub-stories are there in the *Mitrabheda*?
(1) දාහතකි. Seventeen (2) විසිදෙකකි. Twenty Two (3) තිස්අටකි. Thirty Eight (4) හතළිස් නවයකි. Forty Nine


40. කාලිදාසයන් විසින් රචනා කරන ලද දෘශ්‍යකාව්‍ය ගණන කීය ද?
How many dramas have been composed by *Kalidāsa* ?
(1) දෙකකි. Two (2) තුනකි. Three (3) හතරකි. Four (4) දහතුනකි. Thirteen

## 2.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 3 | 21. | 4 |
| 02. | 4 | 22. | 2 |
| 03. | 1 | 23. | 1 |
| 04. | 2 | 24. | 3 |
| 05. | 2 | 25. | 1 |
| 06. | 1 | 26. | 2 |
| 07. | 2 | 27. | 2 |
| 08. | 2 | 28. | 2 |
| 09. | 1 | 29. | 1 |
| 10. | 4 | 30. | 3 |
| 11. | 2 | 31. | 4 |
| 12. | 1 | 32. | 2 |
| 13. | 2 | 33. | 2 |
| 14. | 2 | 34. | 3 |
| 15. | 2 | 35. | 2 |
| 16. | 1 | 36. | 1 |
| 17. | 3 | 37. | 1 |
| 18. | 1 | 38. | 2 |
| 19. | 1 | 39. | 2 |
| 20. | 1 | 40. | 2 |

වගුව 2.1
නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

## 2.4 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණ




ප්‍රස්තාරය 2.1; (RD/16/5/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

ඉහත ප්‍රස්තාරයට අනුව 03වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුර සපයා ඇත්තේ 75%ක් වන අතර 31වන ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ 22%ක් වේ. අපේක්ෂකයන් වැඩිම ප්‍රතිශතයක් නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ 03වන ප්‍රශ්නයට වන අතර එහි පහසුතාව 75%කි. මෙහි අපේක්ෂකයන් අඩු ම ප්‍රතිශතයක් නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ 7 වන ප්‍රශ්නයට ය. එහි පහසුතාව 15%කි.

## 2.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | කිසිදු පිළිතුරක් සපයා නොමැත |
| 1 | 3 | 9.92 | 11.56 | 72.79 | 5.37 | 0.36 |
| 2 | 4 | 7.73 | 17.65 | 30.76 | 43.13 | 0.73 |
| 3 | 1 | 75.07 | 5.55 | 16.83 | 2.37 | 0.18 |
| 4 | 2 | 26.48 | 47.41 | 11.01 | 14.47 | 0.64 |
| 5 | 2 | 27.39 | 38.85 | 18.2 | 15.1 | 0.45 |
| 6 | 1 | 16.56 | 24.84 | 39.22 | 18.65 | 0.73 |
| 7 | 2 | 23.2 | 14.83 | 10.65 | 50.68 | 0.64 |
| 8 | 2 | 12.47 | 54.14 | 19.47 | 13.38 | 0.55 |
| 9 | 1 | 26.11 | 24.75 | 25.39 | 22.66 | 1.09 |
| 10 | 4 | 19.2 | 14.65 | 18.11 | 47.77 | 0.27 |
| 11 | 2 | 13.19 | 45.13 | 20.47 | 20.93 | 0.27 |
| 12 | 1 | 65.24 | 23.02 | 7.83 | 3.73 | 0.18 |
| 13 | 2 | 15.65 | 37.31 | 21.57 | 25.39 | 0.09 |
| 14 | 2 | 35.76 | 24.11 | 14.65 | 25.11 | 0.36 |
| 15 | 2 | 28.3 | 49.32 | 14.92 | 6.64 | 0.82 |
| 16 | 1 | 44.49 | 16.29 | 16.56 | 22.57 | 0.09 |
| 17 | 3 | 10.46 | 26.11 | 40.67 | 22.38 | 0.36 |
| 18 | 1 | 27.3 | 33.58 | 21.2 | 17.74 | 0.18 |
| 19 | 1 | 25.84 | 25.57 | 33.39 | 14.74 | 0.45 |
| 20 | 2 | 31.76 | 24.84 | 22.75 | 19.84 | 0.82 |
| 21 | 4 | 20.56 | 8.83 | 12.83 | 57.42 | 0.36 |
| 22 | 2 | 37.49 | 26.57 | 20.56 | 15.2 | 0.18 |
| 23 | 1 | 23.2 | 25.57 | 32.21 | 18.29 | 0.73 |
| 24 | 3 | 9.74 | 18.74 | 65.15 | 6.28 | 0.09 |
| 25 | 1 | 25.02 | 19.29 | 15.2 | 39.95 | 0.55 |
| 26 | 2 | 28.94 | 40.04 | 15.29 | 15.01 | 0.73 |
| 27 | 2 | 20.84 | 36.12 | 15.47 | 27.12 | 0.45 |
| 28 | 2 | 36.76 | 49.77 | 8.64 | 4.46 | 0.36 |
| 29 | 1 | 39.13 | 42.22 | 12.19 | 5.82 | 0.64 |
| 30 | 3 | 36.12 | 14.56 | 42.13 | 6.92 | 0.27 |
| 31 | 4 | 20.75 | 21.11 | 34.49 | 22.38 | 1.27 |
| 32 | 2 | 32.21 | 51.77 | 9.65 | 6.28 | 0.09 |
| 33 | 2 | 43.86 | 32.76 | 16.01 | 6.46 | 0.91 |
| 34 | 3 | 11.83 | 26.84 | 47.41 | 13.47 | 0.45 |
| 35 | 2 | 11.01 | 32.58 | 26.11 | 29.66 | 0.64 |
| 36 | 1 | 31.67 | 15.56 | 42.49 | 9.55 | 0.73 |
| 37 | 1 | 48.41 | 18.02 | 23.93 | 8.55 | 1.09 |
| 38 | 2 | 8.92 | 69.43 | 7.73 | 13.47 | 0.45 |
| 39 | 2 | 22.75 | 56.78 | 14.74 | 4.91 | 0.82 |
| 40 | 2 | 19.56 | 46.59 | 23.2 | 10.01 | 0.64 |

වගුව 2.2

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

## 2.6 තේමා අනුව I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය

I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සකස් කිරීමේ දී පදනම් කරගත් තේමා / විෂය ක්ෂේත්‍ර 09කි. ඒ ඒ තේමා විෂය ක්ෂේත්‍ර අනුව ප්‍රශ්න සකස් වී ඇති ආකාරය මෙසේය.


| තේමාව / විෂය ක්ෂේත්‍රය | ප්‍රශ්න අංකය |
|---|---|
| වර්ණමාලාව | 1 , 2, 3 |
| නාම වරනැගීම | 4, 5, 6, 7 |
| ආඛ්‍යාත වරනැගීම | 8, 9, 10, 11 |
| සන්ධි | 12, 13, 14, 15 |
| සමාස | 16, 17 |
| තද්ධිත | 18, 19 |
| කෘදන්ත | 20, 21, 22, 23 |
| වාක්‍යනිර්මාණ | 24, 25, 26, 27 |
| සාහිත්‍යය | 28 , 29, 30, 31, 32, 33, 34, 35, 36, 37, 38, 39, 40 |

වගුව 2.3

I ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විතය.

I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සකස් කිරීමේ දී පදනම් කරගත් තේමා/ විෂය ක්ෂේත්‍ර සංඛ්‍යාව 09කි.


එම තේමා/ විෂය ක්ෂේත්‍ර 09 අතුරෙන් වැඩි ම ප්‍රශ්න සංඛ්‍යාවක් ඉදිරිපත් වී ඇත්තේ සාහිත්‍යය තේමාව/ විෂය ක්ෂේත්‍රය යටතේ වන අතර ඉදිරිපත් වී ඇති ප්‍රශ්න සංඛ්‍යාව 13කි. සමාස තේමා/ විෂය ක්ෂේත්‍රය යටතේ ඉදිරිපත් වී ඇති ප්‍රශ්න සංඛ්‍යාව 02කි.




ප්‍රස්තාරය 2.1

I පත්‍රයෙහි ප්‍රශ්න 40 අතුරෙන් 03 ප්‍රශ්නයෙහි පහසුතාව 75%කි. එය සමස්ත I පත්‍රයෙහිම පහසුතාව වැඩිම ප්‍රශ්නය වන අතර වර්ණමාලා තේමාව යටතේ විමසන ලද ප්‍රශ්නයකි. සමස්ත I පත්‍රයෙහි අඩුම පහසුතාව සහිත 7වන ප්‍රශ්නයෙහි පහසුතාව 15%කි. එය නාමවරනැගීම තේමාව යටතේ ඉදිරිපත්ව ඇත.

I පත්‍රයෙහි සාහිත්‍ය තේමාව යටතේ ඉදිරිපත් කර තිබූ ප්‍රශ්න 13 අතුරෙන් පහසුතාව වැඩිම 38 ප්‍රශ්නයෙහි පහසුතාව 69%කි. මෙම තේමාව යටතේ 50%ක් හෝ ඊට වැඩි පහසුතාවක් ඇති ප්‍රශ්න 04කි. ඒවා නම් 28, 32, 38, හා 39 ප්‍රශ්නයි. අඩුම පහසුතාව සහිත 31 ප්‍රශ්නයේ පහසුතාව 22%කි.




ප්‍රස්තාරය 2.2

සංස්කෘත I පත්‍රය සැකසීමේ දී පදනම් කරගත් තේමා 9 අතුරෙන් එක් එක් තේමාවට/විෂය ක්ෂේත්‍රයට අයත් ප්‍රශ්නවල පහසුතාව සලකා එක් එක් තේමාවෙහි/ විෂය ක්ෂේත්‍රයෙහි මධ්‍යක පහසුතාව හා එක් එක් තේමාව යටතේ ඉදිරිපත් වී තිබූ ප්‍රශ්න ප්‍රතිශතය මෙම ප්‍රස්තාරයෙන් නිරූපණය කර ඇත. ඉහත ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්න පත්‍රයේ වැඩිම ප්‍රශ්න සංඛ්‍යාවක් ඉදිරිපත් කර ඇත්තේ සාහිත්‍ය තේමාව යටතේ වන අතර ඒවායේ මධ්‍යක පහසුතාව 44%කි. වර්ණමාලාව තේමාව යටතේ ඉදිරිපත් කර ඇති ප්‍රශ්න ප්‍රතිශතය 8%ක් වන අතර එහි මධ්‍යක පහසුතාව 64%කි.

| තේමාව /විෂය ක්ෂේත්‍රය | පහසුතාව වැඩි ම ප්‍රශ්නය හා එහි පහසුතාව | පහසුතාව අඩු ම ප්‍රශ්නය හා එහි පහසුතාව | ප්‍රශ්නවල සමස්ත පහසුතාව |
|---|---|---|---|
| වර්ණමාලාව | 3 (75%) | 2 (43%) | 64% |
| නාම වරනැගීම | 4 (47%) | 7 (15%) | 30% |
| ආඛ්‍යාත වරනැගීම | 8 (54%) | 9 (26 %) | 43% |
| සන්ධි | 12 (65%) | 14 (24%) | 44% |
| සමාස | 16 (44%) | 17 (41%) | 43% |
| තද්ධිත | 18 (27%) | 19 (26%) | 27% |
| කෘදන්ත | 21 (57%) | 23 (23%) | 35% |
| වාක්‍යනිර්මාණ | 24 (65%) | 25 (25%) | 42% |
| සාහිත්‍යය | 38 (69%) | 31 (22%) | 44% |

වගුව 2.3

## 2.7 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

2020 වර්ෂයේ සංස්කෘත විෂයයෙහි I පත්‍රය සැකසීමේ දී සාහිත්‍ය තේමාවට අදාළ ව ප්‍රශ්න 13ක් ද, නාම වරනැගීම, ආඛ්‍යාත වරනැගීම, සන්ධි, කෘදන්ත හා වාක්‍යනිර්මාණය යන තේමාවන්ට අදාළ ව ප්‍රශ්න 04 බැගින් ද ඉදිරිපත් කර ඇත.

වර්ණමාලාව නම් ඒකකයට (නිපුණතාවට) අනුව සකස් වී ඇති 1, 2 හා 3 යන ප්‍රශ්න අතුරෙන් 3 ප්‍රශ්නය සඳහා පහසුතාව 75%කි. 2 ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන් නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ 43%ක ප්‍රමාණයකි. මෙම ඒකකයට අදාළ 2 ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන් 30%ක් පමණ පිළිතුර ලෙස තෝරාගෙන ඇත්තේ 3 වරණයයි. අපේක්ෂකයන් බහුතරයක් එලෙස 3 වරණය තෝරා ගෙන ඇත්තේ වර්ණමාලාවේ ප්‍රධාන ප්‍රභේදයන්ට අදාළ අක්ෂර පිළිබඳ මනා අවබෝධයක් නොතිබීම නිසා ය. වෘද්ධි ආදි මූලික සංඥා නාම හඳුනාගැනීම හා අවබෝධ කර ගැනීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ප්‍රමුඛතාව ලබා දිය යුතු වේ.

නාම වරනැගීම විෂය ක්ෂේත්‍රයට අදාළ 4, 5, 6 හා 7 යන ප්‍රශ්න අතුරෙන් වැඩි ම පහසුතාව සහිත 4 ප්‍රශ්නයෙහි පහසුතාව 47%කි. අඩු ම පහසුතාව සහිත 7 ප්‍රශ්නයෙහි පහසුතාව 15%කි. 7 ප්‍රශ්නයට පිළිතුර ලෙස 51%ක බහුතර අපේක්ෂකයන් තෝරා ගෙන ඇත්තේ 4 වරණය යි. අපේක්ෂකයා පිළිතුර සඳහා 4 වරණය තෝරා ගැනීමට හේතු වී ඇත්තේ නාම වරනැගීමෙහි ලිංගභේදය හා අර්ථය පිළිබඳ අවබෝධය අවම වීම නිසා විය හැකිය. නාම වරනැගීමේ දී ලිංගභේදය හා විභක්ති අර්ථ පිළිබඳ දැනුම ලබා දීමට ප්‍රමුඛතාවක් ලබා දිය යුතුයැයි යෝජනා කෙරේ.

ආඛ්‍යාත වරනැගීම විෂය ක්ෂේත්‍රයට අදාළ 8 , 9, 10 හා 11 ප්‍රශ්න අතුරෙන් පහසුතාව වැඩි ම ප්‍රශ්නය 8 ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 54%කි. අවම පහසුතාව 9 ප්‍රශ්නයයි. එහි පහසුතාව 26%කි. 9 ප්‍රශ්නයට පිළිතුර ලෙස අපේක්ෂකයන් වරණ 4 ම සමාන ප්‍රතිශතයකින් තෝරා ගෙන ඇත. පිළිතුර සඳහා අපේක්ෂක-යන්ට වරණ හතර ම තෝරා ගැනීමට හේතු වී ඇත්තේ ආඛ්‍යාත වරනැගීම හා පෙළපොතෙහි ලකාර සඳහා ලබා දී ඇති පර්යාය වචන පිළිබඳ සැලකිල්ලක් නොදැක්වීමයි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පෙළපොත නිසිලෙස පරිහරණය කිරීමත් ආඛ්‍යාත වරනැගීම හා ඒවායෙහි අර්ථ පිළිබඳ අවබෝධය ලබා දීමත් සුදුසු වේ.

සන්ධි විෂය ක්ෂේත්‍රයට අදාළ 12, 13, 14 හා 15 ප්‍රශ්න අතුරෙන් පහසුතාව වැඩිම 12 ප්‍රශ්නයෙහි පහසුතාව 65%කි. පහසුතාව අඩුම 14 ප්‍රශ්නයෙහි පහසුතාව 24%කි. අපේක්ෂකයන් 36%ක ප්‍රතිශතයක් පිළිතුර ලෙස තෝරා ඇත්තේ පළමු වරණයයි. අපේක්ෂකයන් සංස්කෘත භාෂාවෙන් දක්වා ඇති සන්ධි පදයක් නිවැරදි ව විශ්ලේෂණය කර ගැනීමේ දුර්වලතාවක් පෙන්නුම් කර ඇත. සන්ධි ප්‍රභේදයන් හඳුනාග ැනීමට ඇති මූලික ලක්ෂණ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කිරීමට යෝජනා කෙරේ.

සමාස විෂය ක්ෂේත්‍රයට අදාළ 16, 17 ප්‍රශ්න අතුරෙන් 16 ප්‍රශ්නයෙහි පහසුතාව 44%කි. එය එම විෂය ක්ෂේත්‍රයට අදාළ පහසුතාව වැඩිම ප්‍රශ්නයයි. 17 ප්‍රශ්නයෙහි පහසුතාව 41%කි. මෙම ප්‍රශ්නයට පිළිතුර ලෙස අපේක්ෂකයන් 26%ක් තෝරා ගෙන ඇත්තේ 2 වරණයයි. මෙමගින් පෙන්නුම් කරන්නේ සමාස පිළිබඳ මූලික අවබෝධයක් අපේක්ෂකයන්ට නොමැති බවයි. සමාසවල මූලික ප්‍රභේද පිළිබඳ අවබෝධය ලබා දීමට යෝජනා කෙරේ. ඒ සඳහා සරල, ප්‍රායෝගික උදාහරණ මෙන් ම පෙළපොත, නිර්දිෂ්ට ග්‍රන්ථ භාවිත කිරීම සිදු කළ යුතු ය.

තද්ධිත විෂය ක්ෂේත්‍රයට අදාළ 18, 19 ප්‍රශ්න අතුරෙන් 18 ප්‍රශ්නය සඳහා 27%ක් ද 19 ප්‍රශ්නය සඳහා 26%ක් ද වශයෙන් ප්‍රශ්න දෙකෙහිම පහසුතාව අඩු මට්ටමකි. මෙහි දී තද්ධිත ප්‍රභේද හා ප්‍රත්‍යයන්හි අර්ථ පිළිබඳ නිසි අවබෝධයක් අතිබහුතරයක් අපේක්ෂකයන් තුළ නොමැති බව පෙනේ. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී තද්ධිත ප්‍රභේද සහ ප්‍රත්‍යය පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීමට යෝජනා කෙරේ.

කෘදන්ත විෂය ක්ෂේත්‍රයට අදාළ 20, 21, 22 හා 23 යන ප්‍රශ්න අතුරෙන් ඉහළ පහසුතාවක් සහිත 21 ප්‍රශ්නයෙහි පහසුතාව 57%කි. අවම පහසුතාවක් සහිත 23 ප්‍රශ්නයෙහි පහසුතාව 23%කි. මෙහිදී අපේක්ෂකයන් වැඩි පිරිසක් පිළිතුර ලෙස තෝරා ඇත්තේ තුන්වන වරණයයි. එය ප්‍රතිශතයක් ලෙස 32%කි. කෘදන්ත ව්‍යාකරණ ලෙස ඉගෙනුම් ක්‍රියාවලියේ දී යොදා ගෙන තිබුණ ද ප්‍රායෝගික භාවිතයේ දී කෘදන්ත පද හඳුනාගැනීමේ දුර්වලතාවක් පෙන්නුම් කරයි. ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යොදා ගැනෙන ව්‍යාකරණ ප්‍රායෝගික භාවිතය සඳහා යොදා ගන්නා ආකාරය පිළිබඳ අවධානය යොමු කිරීමට යෝජනා කෙරේ.

වාක්‍යනිර්මාණය විෂය ක්ෂේත්‍රයට අදාළ 24, 25, 26 හා 27 යන ප්‍රශ්න අතුරෙන් 24 ප්‍රශ්නයෙහි පහසුතාව 65%කි. 25 ප්‍රශ්නය අඩු ම පහසුතාවක් සහිත ප්‍රශ්නය වන අතර, එහි පහසුතාව 25%කි. 25 ප්‍රශ්නයට පිළිතුර ලෙස අපේක්ෂකයන් 40%ක් තෝරාගෙන ඇත්තේ 4 වරණය යි. මේ සඳහා සංස්කෘත දේවනාගරී පෙළ කියවීමේ දුර්වලතාව, වාක්‍ය, පද විශ්ලේෂණය කර ගැනීමේ අපහසුතාව හා පර්යාය පද පිළිබඳ අවබෝධය අඩුවීම බලපා ඇති බව උපකල්පනය කළ හැකි ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පාඨග්‍රන්ථ කියවීමේ දී නාගරී අක්ෂරයන්හි සංයුක්තාක්ෂර භාවිතයට හුරු කරවීම, වාක්‍යයක පද බෙදා දැක්වීමට ශිෂ්‍යයා උනන්දු කරවීම, පර්යාය පද පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට ශිෂ්‍යයා යොමු කරවීමට කටයුතු කළ යුතු ය.

සාහිත්‍ය විෂය ක්ෂේත්‍රයට අදාළ 28, 29, 30, 31, 32, 33, 34, 35, 36, 37, 38, 39 හා 40 යන ප්‍රශ්න අතුරෙන් 38 ප්‍රශ්නයෙහි පහසුතාව 60%කි. අවම පහසුතාවක් සහිත 31 ප්‍රශ්නයෙහි පහසුතාව 22%කි. අපේක්ෂකයන්ගෙන් 34%ක් එම ප්‍රශ්නයට පිළිතුර ලෙස තෝරාගෙන ඇත්තේ තුන්වන වරණය යි. බහුතරයක් අපේක්ෂකයන් මෙම පිළිතුර තෝරා ගැනීමට හේතු වී ඇත්තේ ප්‍රශ්නය පිළිබඳ නිසි අවබෝධයකින් තොර ව පිළිතුර ලකුණු කිරීම නිසා බව පෙන්වා දිය හැකි ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පෙළපොතෙහි දැක්වෙන සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ කොටස් අවබෝධයෙන් යුතු ව හැදෑරීමටත් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී සාවධාන ව පිළිතුරු සැපයීමටත් අපේක්ෂකයන් පුහුණු කළ යුතු බවට යෝජනා කෙරේ.

# II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 3 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 3 .1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**II** පත්‍රය - කාලය **:** පැය 03යි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත ය.

**I** කොටස - අනිවාර්ය ප්‍රශ්න දෙකකින් සමන්විත ය.
එක් ප්‍රශ්නයකට ලකුණු **12** බැගින් ලකුණු **24**කි.


**II** කොටස - ප්‍රශ්න හයකින් සමන්විත ය. ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
එක් ප්‍රශ්නයකට ලකුණු **12** බැගින් ලකුණු **36**කි.

**II** පත්‍රය සඳහා මුළු ලකුණු = **24 + 36 = 60**

අවසාන ලකුණු ගණනය කිරීම **:**

| | | |
|---|---|---|
| **I** පත්‍රය | = | **40** |
| **II** පත්‍රය | = | **60** |
| අවසාන ලකුණු | = | **100** |

## 3.2 II වන ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න තෝරා ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයන් පෙන්වා ඇත.

උදා :- 1 හා 2 ප්‍රශ්න අනිවාර්යය වුවත් 2 ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ 98%ක පමණ පිරිසකි. සෙසු ප්‍රශ්න අතුරෙන් අපේක්ෂකයන් වැඩි පිරිසක් පිළිතුරු සැපයීම සඳහා 3 ප්‍රශ්නය තෝරාගෙන ඇති අතර ප්‍රතිශතයක් ලෙස 72%ක් පමණ වේ. 8 ප්‍රශ්නය තෝරාගත් පිරිස 18%ක් පමණ වේ. එම ප්‍රශ්නය අඩුම අපේක්ෂකයන් පිරිසක් තෝරාගත් ප්‍රශ්නය වේ.

ප්‍රස්තාරය 3.1 ( RD/16/2/MPF) පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකසන ලදී)

## 3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත දී උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා-: මෙහි 1 ප්‍රශ්නය සඳහා වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 12කි. අපේක්ෂකයන් 69%ක පිරිසක් ලකුණු 0-3 අතර ලබාගෙන ඇත.
අපේක්ෂකයන් 16%ක පිරිසක් ලකුණු 4- 6 අතර ද ලකුණු 7-9 අතර 9%ක් ද අපේක්ෂකයන් 6%ක් පමණ ලකුණු 10- 12 අතර ද ලබාගෙන ඇත.

ප්‍රස්තාරය 3.2 ( RD/16/2/MPF) පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකසන ලදී)

## 3.4 II වන ප්‍රශ්න පත්‍රයේ සාධනය පිළිබඳ විශ්ලේෂණය




ප්‍රස්තාරය 3.3: (RD/16/4/MPF) පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

උදා:- අපේක්ෂකයන් වැඩිම සංඛ්‍යාවක් සාර්ථකව පිළිතුරු සපයා ඇති 7 (ii) (a) අනුකොටසෙහි පහසුතා දර්ශකය 0.88කි. එනම් 7 (ii) (a) අනුකොටස සඳහා අපේක්ෂකයන්ගෙන් 88%ක් සාර්ථකව පිළිතුරු සපයා ඇත. ඒ අනුව එම අනුකොටසෙහි පහසුතාව 88%කි. අපේක්ෂකයන් අතුරෙන් අවම සංඛ්‍යාවක් සාර්ථකව පිළිතුරු සපයා ඇති 3 (iii) කොටසෙහි පහසුතා දර්ශකය 0.08කි. එනම් 3 (ii) කොටස සඳහා අපේක්ෂකයන් 8%ක් පමණ සාර්ථකව පිළිතුරු සපයා ඇත. ඒ අනුව එම කොටසෙහි පහසුතාව 8%කි.

## 3.5 II ප්‍රශ්න පත්‍රය එක් එක් ප්‍රශ්නය එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

### 01 ප්‍රශ්නය

(i) පහත සඳහන් ගද්‍යපාඨ සිංහලයට නගන්න. (ලකුණු 06 යි)
Translate the following prose quotations into English. (06 marks)

१. आसीत् कोऽपि महान् धनिकः कस्मिंश्चिन्नगरे।
කිසියම් නගරයක කිසියම් මහා ධනවතෙක් විය.

२. यच्छतु महाराजस्तर्हि राज्यार्धं स्वकन्यां च मह्यम्।
එසේ වී නම් මහරජ, රජයෙන් අඩක් ද සිය දියණිය ද මට දෙනු ලැබේවා!

३. लोभाभिभूतेन त्वया न कृतं मद्वचः।
ලෝභයෙන් මැඩුණු තා විසින් මාගේ වචනය ඉටු නොකරන ලදී.


(ii) පහත සඳහන් පද්‍යපාඨ සිංහලයට නගන්න. (ලකුණු 06 යි)
Translate the following verse quotations into English. (06 marks)

१. वरं बुद्धिर्न सा विद्या विद्याया बुद्धिरुत्तमा।
බුද්ධිය ශ්‍රේෂ්ඨ ය. (බුද්ධිය හීන වූ) විද්‍යාව ශ්‍රේෂ්ඨ නොවේ. (එහෙයින්) විද්‍යාවට වඩා බුද්ධිය උතුම් වේ.

२. श्रुत्वा महर्षेः स गृहप्रवेशं सत्कारहीनं च पुनः प्रयाणम्।
ඒ බුදුරජාණන් වහන්සේ ගෙට පිවිසීමත් සත්කාරයකින් තොරව නැවත ආපසු යාම ගැන ද අසා.

३. उदारचरितानां तु वसुधैव कुटुम्बकम्।
උදාර අදහස් (චරිත) ඇති අයට වනාහි පොළොව ම එකම පවුලකි.


### 01 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා




පළමු ප්‍රශ්නය අනිවාර්යය ප්‍රශ්නයකි.
අංක 3.4 ප්‍රස්තාරය අනුව අපේක්ෂකයන් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමේ දී 22%ක පහසුතාවක් දක්වා ඇත. ලකුණු ලබා ගැනීමේ දී,

0 - 3 ප්‍රාන්තරයේ 69%ක් ද,
4 - 6 ප්‍රාන්තරයේ 16%ක් ද,
7 - 9 ප්‍රාන්තරයේ 9%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 6%ක් ද,
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හෝ ඊට වඩා ලබා ගත් පිරිස 6%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 69%ක් ම ලබාගෙන ඇත්තේ ලකුණු 3ක් හෝ ඊට අඩුවෙනි.




- මෙම ප්‍රශ්නයෙහි කොටස් දෙකකි. එහි පළමු කොටස නිර්දිෂ්ට ගද්‍යපාඨ ඇසුරෙන් ලබා දී ඇති අතර, දෙවන කොටස නිර්දිෂ්ට පද්‍යපාඨ ඇසුරෙන් ලබා දී ඇත. පළමු කොටස සඳහා පහසුතාව 28%කි. දෙවන කොටස සඳහා පහසුතාව 17%කි.

- නිර්දිෂ්ට ගද්‍යපද්‍ය පාඨවල අර්ථ පාඩම් ගැනීම හා ලියවීම හා කියවීම මෙන්ම ගද්‍ය පද්‍ය පාඨයන්හි වාක්‍ය ඛණ්ඩ පිළිබඳ පරිවර්තන අභ්‍යාස සඳහා සිසුන් හුරු කිරීමට යෝජනා කෙරේ. ප්‍රශ්නපත්‍ර ව්‍යූහය සඳහා සිසුන් හුරු කිරීමට ද යෝජනා කෙරේ.

**02** ප්‍රශ්නය

(i) अनभ्यासे विषं विद्या ।

මේ ප්‍රකාශයෙහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

Explain the significance of this statement. *(04 marks)*

නැවත නැවත පුරුදු නො කරන විට දැනීම විෂ වන බවත්, නැවත නැවත පුරුදු කරන විට දැනීම යහපත් වන බව පිළිබඳ කරුණු දක්වා තිබීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

(ii) නිර්දිෂ්ටපාඨ ග්‍රන්ථාගත ගද්‍ය හා පද්‍ය ප්‍රකාශ ආශ්‍රයෙන් පහත සඳහන් මාතෘකා අතුරෙන් එකක් පිළිබඳ විවරණයක් කරන්න. (ලකුණු 08 යි)

Make a review on either of following topics based on prescribed verse and prose statements. *(08 marks)*

(අ) ලෝභකම විනාශයට හේතු වේ. (බ්‍රාහ්මණසර්ප කථාව ආශ්‍රයෙන්)


(a) The Greedy is the cause of destruction. (*Brāhmaṇasarpa*)

(ආ) අපරීක්ෂාකාරීවීම විනාශයට දොරටුවකි. (එකෝදරභාරුණ්ඩ කථාව ආශ්‍රයෙන්)

(b) Being careless is the door of destruction. (*Ekodarabhāruṇḍa*)

(ii) නියමිත ඉඩ නිසි පරිදි ප්‍රයෝජනයට ගෙන තිබිය යුතු ය. මාතෘකාවට අදාළ ව පිළිතුර ලියා තිබිය යුතු ය. ප්‍රධාන මාතෘකාවන්ට අදාළ නිර්දිෂ්ට කථාව ඔස්සේ කරුණු ඉදිරිපත් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය සසඳා බලා ලකුණු ලබා දෙන ලදී.


**02 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා**




දෙවන ප්‍රශ්නය අනිවාර්යය ප්‍රශ්නයකි.
අංක 3.4 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නය සඳහා සමස්ත පහසුතාව 48% කි. ලකුණු ලබා ගැනීමේ දී,

0 - 3 ප්‍රාන්තරයේ 35%ක් ද,
4 - 6 ප්‍රාන්තරයේ 21%ක් ද,
7 - 9 ප්‍රාන්තරයේ 24%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 20%ක් ද,
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වඩා ලබා ගත් පිරිස 20%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 35%ක් ම ලබාගෙන ඇත්තේ ලකුණු 3ක් හෝ ඊට අඩුවෙනි.




- මෙහි දෙවෙනි කොටසෙහි අනුකොටස් දෙකකි. (ii) (a) අනුකොටස සඳහා 51%ක පහසුතාවක් ද (ii) (b) අනුකොටස සඳහා 49%ක පහසුතාවක් ද ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයෙහි (i) කොටස සඳහා පහසුතාව 45%කි.

- මෙම ප්‍රශ්නයෙහි (ii) (a) අනුකොටසට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් තුළ පෙළපොතෙහි සඳහන් මාතෘකා පාඨ හා විශේෂ උද්ධෘත අධ්‍යයනය සඳහා අවධානය යොමු කිරීමට යෝජනා කෙරේ.

- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි උද්ධෘත පාඨ ආශ්‍රයෙන් නිර්මාණාත්මක වැකි කිහිපයක් ලිවීම හුරු කිරීමට යෝජනා කෙරේ.

- ගද්‍යපාඨ පරිවර්තනයට පෙර මාතෘභාෂාවෙන් කතාව කියා දී ශිෂ්‍යයාට එම කතාව මතකයෙන් ලිවීම, කීම හා චිත්‍ර ආශ්‍රයෙන් ඇඳ දැක්වීම ආදි ශිෂ්‍ය ක්‍රියාකාරකම්වල යෙදවීමට යෝජනා කෙරේ.

**03** ප්‍රශ්නය

03. (i) इ කාරයෙහි ගුණ අක්ෂරය කුමක් ද? (ලකුණු 02 යි)

Wha he *Guṇa* form of इ is ? (02 marks )

ए

(ii) පහත සඳහන් සාරස්වත සූත්‍රවල තේරුම ලියන්න. (ලකුණු 04 යි)

Write the meaning of the following *Sārasvata sūtrās*. (04 marks)

१. उ ओ। : අවර්ණයෙන් පරව උ වර්ණය සිටි කල්හි එම අවර්ණ උවර්ණ දෙකට ඔ වේ.

२. लृतुलसानां दन्ताः। : ඏ, ඐ, ත, ථ, ද, ධ, න, ල, ස යන මේවා දන්තජාක්ෂරයෝ වෙත්.

३. अन्त्यात् पूर्व उपधा। : ශබ්දයක අන්තිම වර්ණයට පූර්වයෙන් වූ වර්ණය උපධා නම් වේ.

४. अ इ उ ऋ लृ समानाः। : අ, ඉ, උ, ඍ, ඏ යන අකුරු සමානාක්ෂර නම් වේ.

(iii) පහත සඳහන් සන්ධිපද විසන්ධි කරන්න. (ලකුණු 03 යි)

Disjoin the following *sandhi* forms. (03 marks)

१. तथैव। : तथा + एव।

२. शिवास्ते। : शिवाः + ते।


तत + शतेन

(iv) तन्नाम / नार्यश्च / महेन्द्रः යන සන්ධිපද සුදුසු පරිදි වගුගත කරන්න. (ලකුණු 03 යි)

Complete the following table with the appropriate *sandhi* forms तन्नाम / नार्यश्च / महेन्द्रः. (03 marks)

| स्वरसन्धि | व्यञ्जनसन्धि | विसर्गसन्धि |
|---|---|---|
| महेन्द्रः | तन्नाम | नार्यश्च |


**03 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා**




අංක 3.4 ප්‍රස්තාරය අනුව තුන්වන ප්‍රශ්නය සඳහා සමස්ත පහසුතාව 35%කි.
ලකුණු ලබා ගැනීමේ දී ,

0 - 3 ප්‍රාන්තරයේ 40%ක් ද,
4 - 6 ප්‍රාන්තරයේ 38%ක් ද,
7 - 9 ප්‍රාන්තරයේ 19%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 03%ක් ද,
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වඩා ලබා ගත් පිරිස 03%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 40%ක් ම ලබාගෙන ඇත්තේ ලකුණු 03ක් හෝ ඊට අඩුවෙනි.




- සාරස්වත සූත්‍ර හා සන්ධි ඇසුරෙන් මැන බැලෙන නිපුණතාවකි. මෙහි කොටස් 04කි. 3 (i) කොටස සඳහා පහසුතාව 43%ක් ද, 3 (ii) කොටස සඳහා පහසුතාව 41%ක් ද, 3 (iii) කොටස සඳහා පහසුතාව 08%ක් ද, 3 (iv) කොටස සඳහා පහසුතාව 46%ක් ද වේ.

- 4 සහ 5 පෙළපොත්වලට අදාළ මූලික සාරස්වත සූත්‍ර අර්ථ සහිත ව වාචෝද්ගත කිරීමට යෝජනා කෙරේ.

- ප්‍රායෝගික ව්‍යවහාරයේ දී භාවිත වන සන්ධි පද හඳුනා ගැනීමට හා ඒවා විසන්ධි කිරීමට අවශ්‍ය පුහුණු ක්‍රියාකාරකම් සිදු කිරීමට යෝජනා කෙරේ.

**04** ප්‍රශ්නය

(i) नमः යන්න යෙදෙන්නේ ..චතුර්ථී.............. විභක්තිය සමගයි. *(ලකුණු 02 යි)*

नमः governs the ...Dative............................................... case. *(02 marks)*

(ii) පහත සඳහන් පදවල විභක්තිය හා වචනය ලියන්න. *(ලකුණු 04 යි)*

Write the case and the number of the following words. *(04 marks)*


| පදය (word) | විභක්තිය (case) | වචනය (number) |
|---|---|---|
| तस्मै | චතුර්ථී | ඒකවචන |
| भानौ | සප්තමී | ඒකවචන |
| पितुः | පඤ්චමී/ෂෂ්ඨී | ඒකවචන |
| कर्तॄणां | ෂෂ්ඨී | බහුවචන |

(iii) පහත සඳහන් ආදර්ශ පද රටාව දෙස බලා, හිස්තැනට ගැළපෙන වචනය ලියන්න. *(ලකුණු 06 යි)*

Look at the word pattern of the given example and fill in the blanks with the appropriate words accordingly. *(06 marks)*


| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| *प्रथमा* | *बालकः* | *बालकौ* | *बालकाः* |
| प्रथमा | *सः* | तौ | *ते* |
| द्वितीया | कविम् | *कवी* | *कवीन्* |
| तृतीया | *गुरुणा* | गुरुभ्याम् | गुरुभिः |
| सप्तमी | *लतायाम्* | लतयोः | लतासु |

**04 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා**




අංක 3.4 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නය සඳහා සමස්ත පහසුතාව 30%කි.
ලකුණු ලබා ගැනීමේ දී,
0 - 3 ප්‍රාන්තරයේ 42%ක් ද,
4 - 6 ප්‍රාන්තරයේ 32%ක් ද,
7 - 9 ප්‍රාන්තරයේ 18%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 08%ක් ද,
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වඩා ලබා ගත් පිරිස 08%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 42% ක් ම ලබාගෙන ඇත්තේ ලකුණු 03ක් හෝ ඊට අඩුවෙනි.




- මෙම ප්‍රශ්නයට අයත් කොටස් අතුරෙන් පහසුතාව වැඩි (ii) කොටසෙහි පහසුතාව 37%කි. එසේ ම පහසුතාව අඩුම (i) කොටසෙහි පහසුතාව 19%කි.
- 5 වන ශ්‍රේණියට අදාළ පෙළපොතෙහි සඳහන් විභක්ති ප්‍රායෝග පිළිබඳ අවබෝධය ලබාදීමට යෝජනා කෙරේ.
- 4 වන ශ්‍රේණියට අදාළ පෙළපොතෙහි සඳහන් නාම වරනැගීමේ විශේෂතා අධ්‍යයනයට පුහුණු අභ්‍යාස හා ක්‍රියාකාරකම් සිදු කිරීමට යෝජනා කෙරේ.

**05 ප්‍රශ්නය**

(i) උදාහරණය ආශ්‍රයෙන් සුදුසු පරිදි වගුව සම්පූර්ණ කරන්න. *(ලකුණු 02 යි)*
In accordance with the given example, complete the following table. *(02 marks)*

| උදා - eg. लट् | වර්තමාන / present |
|---|---|
| लोट् | ආශිර්වාද හා විධාන (ප්‍රේරණාර්ථ) |
| लृट् | අනාගත කාලය |

(ii) සුදුසු කෘදන්ත රූපවලින් වගුව සම්පූර්ණ කරන්න. *(ලකුණු 04 යි)*
Complete the following table with appropriate *krdantas (participles)*. *(04 marks)*


| √ हृ | √ पा | √ वद् | √ लिख् |
|---|---|---|---|
| पूर्वक्रिया | तुमन्तक्रिया | वर्तमानकालकृदन्त | अतीतकालकृदन्त |
| हृत्वा | पातुम् | वदत् | लिखित |

(iii) පහත සඳහන් වගුව සුදුසු පරිදි සම්පූර්ණ කරන්න. *(ලකුණු 06 යි)*
Complete the following table suitably. *(06 marks)*

| आख्यातपद | लकार | वचन | अर्थ |
|---|---|---|---|
| कुर्वन्ति । | लट् | बहुवचन | කරති |
| अभवत् । | लङ् | एकवचन | විය/ වූවේ ය/ වූවාය |

**05 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා**


**ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය**




අංක 3.4 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නය සඳහා සමස්ත පහසුතාව 37%කි.
ලකුණු ලබා ගැනීමේ දී,

0 - 3 ප්‍රාන්තරයේ 34%ක් ද,
4 - 6 ප්‍රාන්තරයේ 28%ක් ද,
7 - 9 ප්‍රාන්තරයේ 22%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 16%ක් ද,
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හෝ ඊට වඩා ලබා ගත් පිරිස 16%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 34%ක් ම ලබාගෙන ඇත්තේ ලකුණු 03ක් හෝ ඊට අඩුවෙනි.




- මෙම ප්‍රශ්නය කොටස් තුනකි. 05 (i) කොටස සඳහා පහසුතාව 43%ක් ද 05 (ii) කොටස සඳහා පහසුතාව 19 %ක් ද 05 (iii) කොටස සඳහා පහසුතාව 48%ක් ද වේ.

- 1, 4, 6 හා 10 ධාතුගණ මගින් තැනෙන තුමන්ත, පූර්වක්‍රියා, වර්තමාන කෘදන්ත, අතීත කෘදන්තවලට අදාළ ධාතු 30ක් වත් ප්‍රායෝගික ව පුහුණු කරවීමට යෝජනා කෙරේ.

- පෙළපොතෙහි සඳහන් ලකාර හා අර්ථ පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීමට ද යෝජනා කෙරේ.

**06 ප්‍රශ්නය**

(i) नूनमेषा क्षेत्रदेवता मया कदाचिदपि न पूजिता । යන පාඨයෙහි ඇති සමාසපදය කුමක් ද? *(ලකුණු 02 යි)*

What is the *samāsa* word in the phrase नूनमेषा क्षेत्रदेवता मया कदाचिदपि न पूजिता । *(02 marks)*

क्षेत्रदेवता

(ii) वाचाल - श्रामणेर - दृढतर - देवत्वम् මෙම වචන සුදුසු පරිදි වගුගත කරන්න. *(ලකුණු 04 යි)*

Complete the following table with the appropriate derivatives. *(04 marks)*

| भावतद्धित | अतिशयार्थतद्धित | अपत्यतद्धित | अस्त्यर्थतद्धित |
|---|---|---|---|
| देवत्वम् | दृढतर | श्रामणेर | वाचाल |


(iii) පහත දැක්වෙන සමාසපද ඉදිරියෙන් සමාසනාමය ලියන්න. *(ලකුණු 06 යි)*

Write the name of the *samāsa* against each compound. *(06 marks)*

| | |
|---|---|
| गुरुदक्षिणा | तत्पुरुष समास |
| उपनगरम् | अव्ययीभाव समास |
| त्रिभुवनम् | द्विगु समास |
| विद्याधनम् | कर्मधारय समास |
| बहुफलः | बहुव्रीहि समास |
| मातापितरौ | द्वन्द्व समास |

**06 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා**

**ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය**





අංක 3.4 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 36%කි.

ලකුණු ලබා ගැනීමේ දී,

0 - 3 ප්‍රාන්තරයේ 46%ක් ද,
4 - 6 ප්‍රාන්තරයේ 28%ක් ද,
7 - 9 ප්‍රාන්තරයේ 11%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 15%ක් ද,
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හෝ ඊට වඩා ලබා ගත් පිරිස 15%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 46%ක් ම ලබාගෙන ඇත්තේ ලකුණු 03ක් හෝ ඊට අඩුවෙනි.




- මෙය සමාස හා තද්ධිත ඇසුරෙන් මැන බැලෙන නිපුණතාවකි. මෙම ප්‍රශ්නය කොටස් තුනකින් සමන්විත ය. 6 (i) කොටස සඳහා පහසුතාව 45%ක් ද 6 (ii) කොටස සඳහා පහසුතාව 30%ක් ද 6 (iii) කොටස පහසුතාව 33%ක් ද වේ.

- වාක්‍ය ඛණ්ඩයන් තුළ ඇති සමාසපදයක් හඳුනා ගැනීමේ කුසලතාව ප්‍රායෝගික ව පුහුණු කිරීමට යෝජනා කෙරේ.

- පෙළපොතෙහි සඳහන් ලකාර හා අර්ථ පිළිබඳ ව සමාස හා තද්ධිත ප්‍රභේදගත ව හඳුනා ගැනීමට පුහුණු කිරීමට යෝජනා කෙරේ.

**07** ප්‍රශ්නය

(i) වරහන් තුළ ඇති වචන සුදුසු පරිදි යොදා හිස්තැන් පුරවන්න. *(ලකුණු 07 යි)*
Fill in the blanks with the appropriate words given within the brackets. *(07 marks)*

( प्राणसंशयो - चिन्तयामास - सापायेन - यदि - ज्ञात्वा - पञ्जरके - निजावासं)

व्याधस्तु तं पाशादुन्मुच्य ***पञ्जरके*** संस्थाप्य ***निजावासं*** नीतवान्। अथ ***चिन्तयामास*** - किमनेन ***सापायेन*** पक्षिणाहं करिष्यामि। ***यदि*** कदाचित्कोऽप्यमुमीदृशं ***ज्ञात्वा*** राज्ञे निवेदयिष्यति। तन्नूनं ***प्राणसंशयो*** मे भवेत्।

(ii) පහත දැක්වෙන ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. *(ලකුණු 05 යි)*
Answer the questions asked on the following paragraph. (05 marks)

अस्ति कस्मिंश्चित्पर्वतैकदेशे महान्वृक्षः। तत्र च सिम्भुक नाम कोऽपि पक्षी प्रतिवसति स्म। तस्य पुरीषे सुवर्णमुत्पद्यते। अथ कदाचित्तमुद्दिश्य व्याधः कोऽपि समाययौ। स च पक्षी तदग्रत एव पुरीषमुत्ससर्ज। अथ पातसमकालमेव तत्सुवर्णीभूतं दृष्ट्वा व्याधो विस्मयमगमत्- अहो मम शिशुकालादारभ्य शकुणिबन्धव्यसनिनोऽशीतिवर्षाणि समभुवन्। न च कदाचिदपि पक्षीपुरीषे सुवर्णं दृष्टम् इति विचिन्त्य तत्र वृक्षे पाशं बबन्ध।

i. මෙහි සඳහන් කුරුල්ලාගේ නම කුමක් ද?
What is bird's name mentioned here?

*සිම්භුක / सिम्भुक*

ii. අසුචිවල හටගන්නා ලද්දේ මොනවා ද?
What was born in the feces?

*රත්තරන් හටගැණින / पुरीषे सुवर्णमुत्पद्यते।*

iii. වැද්දා පුදුමයට පත්වූයේ කුමක් නිසා ද?
Why did the hunter become wonder?

*කුරුල්ලාගේ අසුචිවල රත්තරන් දැකීමෙන් / सुवर्णीभूतं दृष्ट्वा व्याधो विस्मयमगमत्।*


iv. වැද්දාගේ වයස කීය ද?
What is the age of hunter?

*වයස අසූවකි. / अशीतिवर्षाणि।*

v. වැද්දා කුරුල්ලන් ඇල්ලීම කරන ලද්දේ කුමන කාලයේ සිට ද?
How long has the hunter been catching birds?

*කුඩාකාලයේ පටන් ය. / शिशुकालादारभ्य।*

## 07 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා





අංක 3.4 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 75%කි.

ලකුණු ලබා ගැනීමේ දී,

0 - 3 ප්‍රාන්තරයේ 27%ක් ද,
4 - 6 ප්‍රාන්තරයේ 46%ක් ද,
7 - 9 ප්‍රාන්තරයේ 20%ක් ද,
10 - 12 ප්‍රාන්තරයේ 07%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ ඊට වඩා ලබා ගත් පිරිස 07%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 73%ක් ම ලබාගෙන ඇත්තේ ලකුණු 06ක් හෝ ඊට අඩුවෙනි.




- මෙහි කොටස් දෙකකි. 7 (i) කොටසින් නිර්දිෂ්ට ගද්‍ය පාඨයක වාක්‍ය රටා පිළිබඳ අවබෝධය මැන බැලීම සිදු කෙරේ. එහි පහසුතාව 26%කි. 7 (ii) කොටසින් නිර්දිෂ්ට ගද්‍ය පාඨ ඇසුරෙන් කෙටි ලිඛිත ප්‍රශ්න 5ක් විමසා බලා ඇත. එම ප්‍රශ්නයෙහි පහසුතාව 7 (ii) (a) 88%ක් ද, 7 (ii) (b) 76%ක් ද 7 (ii) (c) 67% ක් ද, 7 (ii) (d) 53% ක් ද 7 (ii) (e) 64 %ක් ද වේ.

- නිර්දිෂ්ට ගද්‍යපාඨ ඇසුරින් ප්‍රශ්නපත්‍ර ආකෘතියට අනුරූප, ආකෘති සකසා සිසුන් ප්‍රායෝගික පුහුණුව සඳහා යොමු කිරීමට යෝජනා කෙරේ.

**08** ප්‍රශ්නය

(i) පහත දැක්වෙන වාක්‍ය සිංහලයට පරිවර්තනය කරන්න. *(ලකුණු 04යි)*
Translate the following sentences into English. *(04 marks)*

१. विनयात् पात्रतां याति ।

*හික්මීමෙන් සුදුසු බවට යයි.*
*The wothiness comes by means of modesty.*

२. त्वया किम् अभिहितम् ।

*නුඹ විසින් කුමක් කියන ලද්දේ ද?*
*What did you say?*

३. यदि पापं न कृतं तर्हि परितापं मा कुरु ।

*ඉදින් පව් නොකළේ නම්, තැවීම නොකරන්න.*
*If you did not commit sins, don't repent.*

४. पठितुं न इच्छसि चेत् गृहं गच्छ ।

*පාඩම් කිරීමට අකැමති නම්, ඉදින් ගෙදර යන්න.*
*If you do not like to study, then go home.*

(ii) පහත දැක්වෙන වාක්‍ය සංස්කෘතයට පරිවර්තනය කරන්න. *(ලකුණු 04 යි)*
Translate the following sentences into Sanskrit. *(04 marks)*

i. ඔහු හැමදාම පාසල් නො යයි.

*सः सदैव पाठशालां न गच्छति ।*

ii. කවදාවත් ආයේ එහෙ යන්න එපා.

*कदापि तत्र मा गच्छ ।*

iii. තාත්තා කාර්යාලයට යන්නේ කීයට ද?


*कदा पिता [जनकः] कार्यालयं गच्छति ?*

iv. ඒ ගමේ පන්සලක් ඇත.

*तस्मिन् ग्रामे पर्णशालाम् अस्ति ।*


(iii) චිත්‍රය ඇසුරෙන් වචන තුනකට නොඅඩු සංස්කෘත වාක්‍ය හතරක් දේවනාගරී අකුරෙන් ලියන්න. (එක ම වචනය දෙවරකට වඩා භාවිත නොකළ යුතු ය.) *(ලකුණු 04 යි)*

Write four sentences each consisting of not less than three words, on the following picture. Use Devanāgarī characters. (The same word should not be used more than twice). *(04 marks)*



**08 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා**

**ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය**





අංක 3.4 ප්‍රස්තාරය අනුව මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 24% කි.

ලකුණු ලබා ගැනීමේ දී,

0-3 ප්‍රාන්තරයේ 35%ක් ද,
4-6 ප්‍රාන්තරයේ 30%ක් ද,
7-9 ප්‍රාන්තරයේ 29%ක් ද,
10-12 ප්‍රාන්තරයේ 6%ක් ද,


වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හෝ ඊට වඩා ලබා ගත් පිරිස 6%කි. ලකුණු 03ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 35%කි.




- මෙම ප්‍රශ්නයෙහි කොටස් අතුරෙන් පහසුතාව වැඩිම (iii) කොටසෙහි පහසුතාව 33%කි. පහසුතාව අඩුම (i) කොටසෙහි පහසුතාව 18%කි.
- සරල වාක්‍ය පරිවර්තනයට ශිෂ්‍යයන් පුහුණු කිරීමට යෝජනා කෙරේ.
- පින්තූර ආශ්‍රයෙන් වාක්‍ය නිර්මාණකරණයට අවශ්‍ය පුහුණු ක්‍රියාකාරකම් සිදු කිරීමට

## 3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ආකාරය ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




ප්‍රස්තාරය 3.4 (RD/16/4/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකසන ලදි)

II ප්‍රශ්න පත්‍රයෙහි පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. සියලු ම අපේක්ෂකයන් එම ප්‍රශ්නයට 100%ක පිළිතුරු සපයා ඇත. එහෙත් එහි පහසුතාව 22%කි. අනිවාර්ය ප්‍රශ්නයක් වන හෙයින්, මෙබඳු ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමේ පුහුණුව සිසුන් අතර සංවර්ධනය කිරීමට දැඩි අවධානයක් යොමු කළ යුතු බව පෙනේ. මෙහි දෙවන ප්‍රශ්නය ද අනිවාර්යය වේ. එම ප්‍රශ්නය සඳහා 98%ක් පමණ පිළිතුරු සපයා ඇති අතර එහි පහසුතාව 48%කි. සමස්තයක් ලෙස පළමුවන හා දෙවන ප්‍රශ්න අනිවාර්යය වුවත්, ඒවායේ පහසුතාව 50%කට වඩා අඩු අගයක් වීම අවධානය යොමු කළ යුතු කාරණයකි.

තෝරාගත යුතු ප්‍රශ්න හය අතුරෙන් පහසුතාව වැඩිම 7 ප්‍රශ්නයෙහි පහසුතාව 75%කි. අපේක්ෂකයන්ගෙන් 70%ක් එම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා ද තෝරාගෙන ඇත. තෝරාගත යුතු ප්‍රශ්න අතුරෙන් තුන්වන ප්‍රශ්නය වැඩි අපේක්ෂකයන් ප්‍රමාණයක් තෝරාගෙන ඇති ප්‍රශ්නය විය. එහි ප්‍රතිශතය 72%කි. නමුත් එම ප්‍රශ්නයෙහි පහසුතාව 35%කි. වර්ණමාලාව, සන්ධි යනාදි මූලික සිද්ධාන්ත පිළිබඳ ව අවබෝධය තවදුරටත් වඩා සංවර්ධනය කළ යුතු බව පෙනේ.

තෝරාගත යුතු ප්‍රශ්න අතුරෙන් අපේක්ෂකයන් අඩුවෙන් ම තෝරාගෙන ඇත්තේ 8 ප්‍රශ්නයයි. අපේක්ෂකයන් අතුරෙන් 18%ක් ප්‍රශ්නය තෝරාගෙන ඇති අතර, එහි පහසුතාව 24% කි. පරිවර්තන ශක්‍යතාව පරීක්ෂා කරනු ලබන එක ම ප්‍රශ්නය මෙය වේ. එසේම දේවනාගරී අක්ෂර රචනයෙහි කුසලතාව පරීක්ෂා කරනු ලබන්නේ ද මෙම ප්‍රශ්නය මගිනි. මේ පිළිබඳ ව අපේක්ෂකයන් අතර අඩු අභිරුචියක් දක්නට ලැබීම මේ සඳහා හේතුවක් විය හැකි ය.

## 4 පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු

- අමතර ව කියවීම් කාලය සඳහා ලබාදෙන විනාඩි 10ක කාලය ප්‍රශ්නපත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව ලබා දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත්, පමණක් යොදා ගත යුතු ය. (එම කාලය පිළිතුරු ලිවීමට යොදා නොගන්න.)

- I පත්‍රයට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන පැහැදිලි එක් කතිර ලකුණක් (X) පමණක් යෙදිය යුතු ය.

- ප්‍රශ්න සඳහා නියමිත කාලය කළමනාකරණය කර ගත යුතු ය.

- II පත්‍රයට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

- පිළිතුරු ලිවීම සඳහා ලබා දී ඇති ඉඩ ප්‍රමාණය පමණක් නිසි ලෙස භාවිතයට ගත යුතු ය.

- ප්‍රශ්න පත්‍රයෙහි ලබා දී ඇති උපදෙස් නිසි ලෙස පිළිපැදිය යුතු ය.

- අනිවාර්යයෙන් පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්යයෙන් කළ යුතු ය.

- පිළිතුරු ලිවීමේ දී නිල් කාබන් පෑනක් පමණක් භාවිත කිරීම වඩා සුදුසු ය.

- නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතු ය.

- භාෂාවට ආවේණික පාරිභාෂික ශබ්ද පමණක් භාවිත කළ යුතු ය. උදා-:(ප්‍රථමා විභක්තිය/ කර්මධාරය/ ද්විගු)

- විභාග අංකය සඳහන් කළ යුතු සෑම ස්ථානයක ම පැහැදිලි ව හා නිවැරදි ව සටහන් කළ යුතු ය.

- ලියන ලද පිළිතුර ඉවත් කිරීමට අවශ්‍ය වූ විට තනි ඉරකින් කපා දමා තම අත්සන යෙදීම කළ යුතු ය.

- පිළිතුරුපත් ඇමිණීමේ දී පිටු අංක පිළිවෙළට ඇමිණිය යුතු ය.

## 5 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා

- අක්ෂරමාලාවේ ප්‍රධාන ප්‍රභේද හා අදාළ අක්ෂර ලිවීම, කියවීම හා නිවැරදි පිළි භාවිතය ආදිය හඳුනාගැනීමේ පුහුණුව ලබාදිය යුතු ය.
- එසේ ම ඒ ඒ අක්ෂර ප්‍රභේදයන්ට අදාළ අක්ෂර සංඛ්‍යාව පිළිබඳ ව ද අවබෝධය ඇති කිරීමට කටයුතු කළ යුතු ය.
- සංයුක්තාක්ෂර ලිවීමේ හා කියවීමේ ශක්‍යතාව සංවර්ධනය කළ යුතු ය.
- සන්ධි වර්ගීකරණයන්ට අදාළ මූලික අවබෝධය පාඨග්‍රන්ථ ආශ්‍රයෙන් හා ප්‍රායෝගික භාෂා ව්‍යවහාරය තුළින් ලබාදීමට කටයුතු කළ යුතු ය.
- සමාස හා තද්ධිත පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් අපේක්ෂා කරන අතර (බුද්ධධර්මය, ධර්මශාලාවල ලඞ්කාද්වීපය, දේශීය, විදේශීය, රාජකීය) වැනි ප්‍රායෝගික උදාහරණ ඔස්සේ ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කළ යුතු ය.
- නාම වරනැගීම ඒකකයට අදාළ ව නාමයන් ලිඞ්ගභේදයට අනුව වර්ගීකරණය වන ආකාරය පිළිබඳ අවබෝධය ඇති කළ යුතු ය.
- ඒ ඒ විභක්ති හා ඒවායෙහි අර්ථයන් පිළිබඳ පුහුණුව තවදුරටත් සංවර්ධනය කළ යුතු ය.
- කෘදන්ත පිළිබඳ සිද්ධාන්තමය දැනුමට අමතර ව ප්‍රායෝගික භාවිතය පිළිබඳ පුහුණුව ඇති කළ යුතු ය.
- සියලු ම ව්‍යාකරණ, සිද්ධාන්තවලට අදාළ උදාහරණ හා භාවිතයන් නිර්දිෂ්ට පාඨග්‍රන්ථ මගින් ඉගැන්වීමට ප්‍රමුඛතාව ලබාදිය යුතු ය.
- නිර්දිෂ්ට ගද්‍ය හා පද්‍ය පාඨයන් හි අර්ථය වාචෝද්ගත කිරීමට අමතර ව වාක්‍ය ඛණ්ඩ වශයෙන් පරිවර්තනය කිරීමේ ශක්‍යතාව ඇති කළ යුතු ය.
- පෙළපොතෙහි භාවිත මාතෘකා පාඨ හා විශේෂ උද්ධෘත පරිවර්තනයට හා විචාරයට ලක් කිරීමට පුහුණුව ලබා දිය යුතු ය.
- නිර්දිෂ්ට ග්‍රන්ථයන් හි කතා පුවත් මාතෘභාෂාවෙන් ලිවීමට හා සිතුවමට නැගීමට නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම ආදි ක්‍රමවේද ඔස්සේ ඉගැන්විය යුතු ය.
- සාරස්වතයෙහි මූලික සූත්‍ර වාචෝද්ගත කරවීම හා ඒවායෙහි අර්ථය පුහුණු කරවිය යුතු ය.
- කාල තුනට අදාළ ව සරල වාක්‍යය මාතෘභාෂාවෙන් සංස්කෘතයට ද සංස්කෘතයෙන් මාතෘභාෂාවට ද පරිවර්තනය කිරීමේ ශක්‍යතාව සංවර්ධනය කළ යුතු ය.
- සංස්කෘත භාෂාවෙන් සරල ගද්‍ය නිර්මාණයක් කිරීමේ හැකියාව ඇති කළ යුතු ය.
- ප්‍රශ්නපත්‍ර ආකෘතියට අදාළ ආදර්ශ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ පුහුණුව ලබා දිය යුතු ය.
- නිර්දිෂ්ට කාල අනුව ලකාර වර්ගීකරණයන්ට අදාළ මූලික රීති පිළිබඳ පුහුණුව ලබා දිය යුතු ය.
- නාම වරනැගීම පහසුවෙන් ලිවීමට, මතකයෙන් කීමට පුහුණුව ලැබෙන පරිදි ක්‍රියාකාරකම් හි යෙදවිය යුතු ය.
- ඡේද ඛණ්ඩ වටහා ගෙන ඒ ඔස්සේ අසන ප්‍රශ්නවලට පිළිතුරු ලියවීමේ පුහුණුව ලබා දිය යුතු ය.
- චිත්‍රයක් ආශ්‍රයෙන් සංස්කෘත වාක්‍ය නිර්මාණයකරණයෙහි යෙදීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සංවර්ධනය